සියවස් ගණනක් පුරා අප රටේ ගෘහාශ්‍රිතව වගා කර ඇති අල බෝග දේශීය අල බෝග ලෙස හැඳින්වුවත් සම්භවය වී ඇත්තේ වෙනත් රටවලය. ඉහළ පෝෂණ අගයක් හා ඖෂධීය ගුණයක් ඇති මෙම අල බෝග අඩු යෙදවුම් වලින් වගා කළ හැකිවීම මෙන්ම රෝග, පළිබෝධ හානි අවමවීම නිසා කුඩා ඉඩ කඩක් සහිත ගෙවත්තක වුවද වගා කිරීමට හැකියාවක් ඇත. ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය සඳහා කුඩා ඉඩකඩ සහිත ගෙවතුවල වස විසෙන් තොර අල බෝග වගා කිරීමට යොමු වෙමු.

## වගා කළ හැකි අල බෝග ප්‍රභේද

### වැල් අල

*නිර්දේශිත ප්‍රභේද*

- රාජ අල
  කැකුළු අල } මහ වැල් අල
- කුකුලල (කඳිරා) කුඩා වැල් අල



*රාජ් අල*



*කුකුලල*

*වගා කරන වෙනත් ප්‍රභේද*

- ජඹුරල
- කහට අල
- නාට්ට අල
- උඩල
- හිඟුරල
- මුරුක්කවල්ලි
- තඹල
- කිරිවැල්විල
- ගෝන අල
- ඇත්පාඩ
- කටු අල
- ඉනි අල
- ලේ දන්ත
- ගුරු අල
- දික් දින
- යාපනය දම්
- රතගල
- ඇඟිලි අල
- රතඹල
- හිරිතල

### කිරි අල වර්ග

- අඩදම් කිරි අල
- රතු කිරි අල
- කහ ඉරි කිරි අල
- දම් කිරි අල



ඉසුරු

### ගහල වර්ග

*නිර්දේශිත ප්‍රභේද*

- ගහල
- දිමුතු



දිමුතු

### ඉන්නල

*නිර්දේශිත ප්‍රභේද*

- දිගටි ඉන්නල
- බෝල ඉන්නල



ඉන්නල

### මඤ්ඤොක්කා

*නිර්දේශිත ප්‍රභේද*

- MU 51
- CARI 555
- කිරි කවඩි
- සුරනිමල
- ස්වර්ණ
- ශානි



කිරි කවඩි

### බතල

*නිර්දේශිත ප්‍රභේද*

- වාරියපොල රතු
- වාරියපොල සුදු
- CARI 9
- CARI 426
- රණබිම
- ගන්නෝරුව සුදු
- ශාන්ති
- අමා
- ධවල



ධවල

### වෙනත් දේශීය අල

- හුලංකීරියා
- බුත්සරණ
- ආටිචෝක්
- කිඩාරන්



ආටිචෝක්

| අල වර්ගය | පරතරය | රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය අක්කර 1/4 සඳහා |
|---|---|---|
| **වැල් අල** | | |
| කුඩා | 1 x 0.5 m | අල කැබලි 3700 |
| ලොකු | 1 x 1 m | අල කැබලි 1000 |
| **කිරි අල** | | |
| තනි වගාව | 1 x 1 m | පැළ 1000 |
| අතුරු වගාව | 1.2 x 1.2 m | පැළ 800 |
| **ගහල** | 60 x 60 cm | පැළ 2780 |
| **ඉන්නල** | 45-60 x 10-20 cm | දඬු කැබලි 11000 |
| **මඤ්ඤොක්කා** | | |
| අතු බෙදෙන වර්ග | 1x1 m | දඬු 1000 |
| මද ලෙසින් අතු බෙදෙන වර්ග | 90 x 90 cm | දඬු 1235 |
| **බතල** | වැටියේ පැළ දෙකක් අතර 20 cm | වැල් කැබලි 7000 |

## රෝපණ ද්‍රව්‍ය

### වැල් අල

- සම්පූර්ණ අල හෝ අල කැබලි බර (ග්‍රෑම් 200)
- ඉහටි කැබලි වඩා සුදුසුයි
- කැපුම් පෘෂ්ඨයේ අළු හෝ දිලීර නාශක තවරා වියළීමට ඉඩ හැර වැලි තවානක සිටුවා අංකුර වැඩුණු පසු සිටුවන්න

### කිරි අල හා ගහල

- සුදුසු මව් අල තෝරා ගන්න
- අඟල් 1 1/2 - 2 පමණ ඝනකම අල කැබලි තවාන්වල සිටුවන්න
- මාස 1 1/2 වයසැති පැළ ක්ෂේත්‍රයේ සිටුවන්න

### ඉන්නල

- බීජ අල තවාන් කරන්න
- තවාන් වලින් ලබා ගන්නා 20 - 30 cm දිග දඬු කැබලි ක්ෂේත්‍රයේ සිටුවන්න

### මඤ්ඤොක්කා

- මධ්‍යම ප්‍රමාණයේ මේරූ 20 - 25 cm දිග කඳ කැබලි
- අංකුර 4 ට නොඅඩු දඬු

### බතල

- 20 cm දිග කක්ෂීය අංකුර 5 - 6 ක් ඇති වැලේ අග්‍රස්ථ කොටස්

## ක්ෂේත්‍රය සැකසීම හා සිටුවීම

- වැල් අල කන්න බෝගයක් බැවින් මාර්තු අප්‍රේල් මාසවල ක්ෂේත්‍රයේ සිටුවන්න
- කුඩා වැල් අල සිටුවීමේදී උස 30 - 45 cm පළල 1 m පාත්තිවල සිටුවන්න
- මහ වැල් අල වලවල්වල කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවන්න
- වැල් අල බෝගවල උසට වැඩෙන වර්ග සඳහා 3 - 4 m පමණ උසට ද උසට නොවැඩෙන වර්ග සඳහා 2 m පමණ උසට ද ආධාරක සිටුවන්න
- වැල් අල වර්ග, ගහල වර්ග ,කිරි අල සහ මඤ්ඤොක්කා සිටුවීමේදී 45 x 45 x 45 cm ප්‍රමාණයේ වලවල් සකසා ගන්න
- මඤ්ඤොක්කා දඬු සිටුවීමේදී දඬු කැබැල්ලෙන් 2/3 පොළොවෙන් ඉහළට සිටිනසේ සිරස්ව හෝ තරමක් ඇලට එක් ස්ථානයක එක් කැබැල්ල බැගින් සිටුවන්න
- බතල දඬු කැබලි 1/3 පසට යටවන සේ ඇලි වැටි ක්‍රමයට හෝ පාත්ති ක්‍රමයට සිටුවීම කරන්න
- බතල වැල් පෙරළීම මඟින් අනවශ්‍ය මුල් වර්ධනය අඩු කර අල අස්වැන්න වැඩි කර ගත හැක
- සෑමවිටම වලවල් පිරවීමේදී කාබනික පොහොර මතුපිට පස් සමඟ කලවම් කරන්න
- වැඩි අස්වැන්නක් සඳහා රසායනික පොහොර එක් කළ හැකිය
- පොහොර යොදන හා වල් මර්දන කටයුතු කරන සෑම විටකම වැලට හෝ ගස මුලට පස් ලං කරන්න
- බහුල ලෙස පැතිරෙන රෝග හා පළිබෝධ හානි අවම බැවින් රසායනික පළිබෝධනාශක භාවිතය අවම කළ හැකිය
- වියළි කාලගුණයකදී බොහෝ අල ප්‍රභේද වල අල මේරූ විට පත්‍ර කහ පැහැයට හැරේ. ඒ අතර අවස්ථාවේදී අස්වැන්න නෙලා ගත යුතුය


තාක්ෂණ දායකත්වය:
ඩී.ඩී. වීරකෝන්
සහකාර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (පුහුණු)
සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - බෝම්බුවල
0342 281 846


"අපේ ආහාර අපිම නිපදවමු"

# ආහාර සුරක්ෂිතතාවය සඳහා අල බෝග වගා කරමු




කෘෂිකර්ම ප්‍රවර්ධන සතිය - 2016
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත